**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2020**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරයේ 16(2) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඇසළ පෙරහැර භාරයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇසළ පෙරහැර භාරයට අයත් මහා භාරකාර දෙපාර්තමේන්තුව භාරයේ පවතින රු.මිලියන 20 ක ස්ථාවර තැන්පතුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පොළී ආදායම රු.1,704,139 ක් වුවත් රු.1,000,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පොළී ආදායම රු.704,139 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සම්පූර්ණ පොළී මුදලම ලබාදෙන ලෙස මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කලද පසුගිය වර්ෂ කීපයේදීම ලබා දී තිබුණේ රුපියල් 1,000,000 බැගින් ය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය තුමාගේ අංක BD/HRD 101/07/3/2014 හා 2014.නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් ගෙවා ඇති පොළී මුදල රු. 1,000,000 ක් වන අතර 2020 වර්ෂය සඳහා ද එම පොළී මුදල අපේක්ෂා කර ඇති බව වාර්තා කරමි. | පොළී ප්‍රතිශතය අනුව පොලිය ගණනය කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙරහැර භාරයෙන් අයවිය යුතු ශේෂය ලෙස රු.16,217,797 ක් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ගිණුම් තුළ ඇතුළත් කර තිබුණද ඇසළ පෙරහැර භාරය විසින් එම මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. | ඇසළ පෙරහැර භාරයේ රුපියල් මිලියන 20 ක මුදල භාරයේ රක්ෂක භාරකරු ලෙස කටයුතු කළ මහා භාරකාර තැන විසින් ප්‍රමුඛ බැංකුවේ තැන්පත් කර ඇති අතර ඊට අදාළ පොළී මුදල | ඇසළ පෙරහැර භාරයේ භාරකරු මහා භාරකාර දෙපාර්තමේන්තුව බැවින් ගෙවිය යුතු මුදලක් පවතින්නේද |

| | | | |
|---|---|---|---|
| | | ලෙස වාර්ෂිකව ඇසළ පෙරහැර භාරය වෙත මුදල් ලබාදීම සිදු කරන ලදී. ඇසළ පෙරහැර භාරය විසින් එය වාර්ෂික ඇසළ පෙරහැර පැවැත්වීමේදී වියදම් පියවීම සඳහා යොදාගෙන ඇති අතර එය නැවත මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදලක් නොවන බව වාර්තා කරමි. | යන්න තහවුරු කරගත යුතු වීම. |

## 1.6 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි වලට ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාර පනත | | | |
| 8(1) වගන්තිය | ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන්, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා සහ ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුව පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | උපදේශක කමිටුවක් පත්කිරීමේදී එය පත්කළ යුතු වන්නේ ඇසළ පෙරහැර භාරයෙන්ම වන බව පනත අනුව නිරීක්ෂණය වන අතර අතිගරු ජනාධිපතිතුමා විසින් නම් කරනු ලැබූ සාමාජිකයින් තිදෙනෙකුද ඊට ඇතුළත් විය යුතුය. මේවන තෙක් ඒ සඳහා තිදෙනෙකු පත්කර නොමැත. උපදේශන කමිටුවේ ප්‍රධානියා වන්නේද ඇසළ පෙරහැර භාරයේ ගරු සභාපති, ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තුමාම වන බැවින් අදාළ කටයුතු බාධාවකින් තොරව මේවන තෙක් ඉටුකර ඇති බව වාර්තා කරමි. | පනත ප්‍රකාරව උපදේශක කමිටුවක් පත් කළ යුතු වීම. |

(ආ)2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | | |
|---|---|---|---|
| i. මු.රෙ. 877 (1)(ඇ) | විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරන ලද අයවැය ලේඛනයක් පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාර අරමුදල් සම්බන්ධ වාර්ෂික අයවැය ලේඛන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු බව සඳහන් වුවද ඇසළ පෙරහැර භාරය නිශ්චිත රේඛීය අමාත්‍යාංශයක් යටතට අයත්වන බවක් පනතේ සඳහන් නොවන බැවින් ආමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් ලබාගත නොහැකි බවත්, කිසිම අමාත්‍යාංශයකින් හෝ දෙපාර්තමේන්තුවකින් ඇසළ පෙරහැර භාරය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ සිදු නොවන බවත්, එබැවින් ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික ඇස්තමේන්තුව ඇසළ පෙරහැර භාරය විසින් අනුමත කිරීමට කටයුතු කර ඇති බවත්, වාර්තා කරමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මු.රෙ. 877 (2) (ඇ) | විධිවිධාන ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේදී පැවති කොරෝනා වෛරස තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා මේවන තෙක් කාර්යසාධන වාර්තාවක් සකස් කර නොමැති බව වාර්තා කරන අතර ඉදිරි වර්ෂයේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව වාර්තා කරමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 516,337 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,757,602 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු.1,241,265 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පෙරහැර මහජනතාවට විවෘත නොකිරීම හේතුවෙන් පෙරහැර ආදායම රු 5,390,600 කින් අඩු වී තිබූ අතර, පෙරහැර වියදම ද රු 6,699,374 කින් අඩු වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.